# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

## Economics

නිපුණතාව - 10

විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේශනය කරයි.

---

# විදේශ මූල්‍ය


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය :ඩබ්. බී අමරසේන**

ර/ බුද්ධජයන්ති මහා විද්‍යාලය


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

**නිපුණතාව - 10.0 විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේශනය කරයි.**

**නිපුණතා මට්ටම - 10.1 ගෙවුම් ශේෂ ලේඛනයේ අන්තර්ගතය විශ්ලේෂණය කරයි.**

❖ ගෙවුම් ශේෂ ලේඛනය -
   - වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ ආර්ථික ප්‍රදේශයක නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ආර්ථික ගණුදෙණු ඇතුළත් කරන ලේඛනය ගෙවුම් ශේෂ ලේඛනයයි.
   - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ගෙවුම් තුලන අත්පොතෙහි හයවන සංස්කරණය (BPM6) ආකෘතියට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනය 2013 වර්ෂයේ සිට සකස් කරයි.

❖ ගෙවුම් තුලන ලේඛනයේ සංයුතිය.
   - නව ආකෘතියට අනුව ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රධාන ගිණුම් 3 ක් තිබේ.
      1. ජංගම ගිණුම
      2. ප්‍රාග්ධන ගිණුම
      3. මූල්‍ය ගිණුම

❖ ජංගම ගිණුම
   - නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන දෘශ්‍ය වෙළඳාම, අදෘශ්‍ය වෙළෙඳාම, සාධක ගණුදෙණු හා සංක්‍රාම බ්වාහයන් ඇතුළත් කරයි.
   - ජංගම ගිණුම උප ගිණුම් 3 කින් යුක්ත වේ.
      1. භාණ්ඩ හා සේවා ගිණුම
      2. ප්‍රාග්ධන ගිණුම
      3. මූල්‍ය ගිණුම

❖ භාණ්ඩ හා සේවා ගිණුම
   - නිෂ්පාදන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වූ දෘශ්‍ය වෙළෙඳාම හා අදෘශ්‍ය වෙළෙඳාම මෙම ගිණුමට ඇතුළත් කරයි.
   - භාණ්ඩ හා සේවා ගිණුම වෙනම උප ගිණුම් 2 ක් ලෙස කාණ්ඩ කරයි.
      1. වෙළෙඳ භාණ්ඩ ගිණුම
      2. සේවා ගිණුම

❖ වෙළෙඳ භාණ්ඩ ගිණුම
   - දෘශ්‍ය අපනයන හා අදෘශ්‍ය ආනයන ගණුදෙනු මෙන්ම,
   - මූල්‍ය නොවන රන් අත්පත් කර ගැනීම හා බැහැර කිරීම සම්බන්ධ ගණුදෙණු වෙළෙඳ භාණ්ඩ ගිණුමට ඇතුළත් කරයි.

- ○ මූල්‍ය නොවන රත්‍රන් යනු මූල්‍ය අධිකාරිය විසින් සංචිත වත්කම් ලෙස තබාගන්නා රත්‍රන් හැර ස්වරණාභරණ හා වෙනත් කාර්මික නිෂ්පාදන කටයුතු සඳහා ද, ධනවත් පුද්ගලයන් විසින් වටිනාකම රැස්කර තබා ගැනීමේ අරමුණින් මිලදී ගන්නා සහ අලෙවි කරන රත්‍රන් මූල්‍ය නොවන රත්‍රන් ලෙස හඳුන්වයි.
- ○ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ විදේශ විනිමය ලැබීම් වලින් විදේශ විනිමය ලැබීම් හට ගන්නා විට ද්විත්ව සටහන් රීතියට අනුව වෙළෙඳ භාණ්ඩ ගිණුමේ බැර සටහනක් ලෙස ද, එහි ප්‍රති සටහන මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු ලෙස හර අයිතමයක් ලෙස සටහන් කරයි.
- ○ විදේශ විනිමය ගෙවීම් මෙහි ප්‍රතිවිරුද්ධ ආකාරයට සටහන් වේ.

❖ සේවා ගිණුම

- ○ නිෂ්පාදන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන අදෘශ්‍ය වෙළෙඳාම සේවා ගිණුමේ ඇතුළත් කරයි.
- ○ සේවා ගිණුමේ පහත සඳහන් ගණුදෙණු වල ලැබීම් හා ගෙවීම් සටහන් කරයි.
  - ▪ ගුවන් හා මුහුදු ප්‍රවාහන සේවා
  - ▪ සංචාරක සේවා (අධ්‍යාපන කටයුතු, වෛද්‍ය, නිල කටයුතු, නිවාඩු ගත කිරීම, වන්දනා ගමන්, සම්මන්ත්‍රණ, ක්‍රීඩා සඳහා සංචාර)
  - ▪ සන්නිවේදන සේවා (තැපැල්, විදුලි, ගුවන් විදුලි, සන්නිවේදන සේවා)
  - ▪ පරිඝනක සන්නිවේදන සේවා (මෘදුකාංග සංවර්ධනය)
  - ▪ ඉදිකිරීම් සේවා
  - ▪ රක්‍ෂණ සේවා (අපනයන, ආනයන රක්‍ෂණ සේවා මෙන්ම ජීවිත හා ජීවිත නොවන රක්‍ෂණ සේවා)
  - ▪ මූල්‍ය සේවා
  - ▪ වෙනත් ව්‍යාපාරික සේවා
  - ▪ වෙනත් තැනක සටහන් නොවන ආණ්ඩුවේ වියදම්.
- ○ සේවා ලැබීම් හා ගෙවීම් අයත් වෙනත් සේවා ගිණුමේ ශේෂයයි.
- ○ ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ඉහත ගණුදෙණු නිසා හටගන්නා ලැබීම් සේවා ගිණුමේ බැර සටහනක් ලෙසත්, ගෙවීම් මූල්‍ය ගිණුමේ මුදල් හා තැම්පතු ලෙස හර සටහන් ලෙසත් ඇතුළත් කරයි.
- ○ ගෙවීම් සිදු කරන විට මෙහි ප්‍රතිවිරුද්ධ ලෙස සටහන් යොදයි.
- ○ භාණ්ඩ ගිණුමේ හා සේවා ගිණුමේ ශේෂ වල එකතුව ශුද්ධ අපනයන ලෙස හඳුන්වයි.

❖ ප්‍රාථමික ආදායම් ගිණුම

- ○ නේවාසිකයන් අනේවාසිකයන් අතර, නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස හට ගන්නා ආදායම් ලැබීම් හා ගෙවීම් මෙම ගිණුමේ ඇතුළත් කරයි.

- පහත සඳහන් ගණුදෙණු උදාහරණ ලෙස දැක්විය හැකිය.
    - සේවක වැටුප් (විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සංවිධාන වල වැටුප්)
    - උපදේශන සේවා
    - ඍජු ආයෝජන ආදායම්
    - පොලී ආදායම්
    - නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ඇසුරින් උපයා ගන්නා ආදායම්
- ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය ශුද්ධ ප්‍රාථමික ආදායම වේ.
- ප්‍රාථමික ආදායම් ලැබීම් සිදුවන විට ප්‍රාථමික ආදායම් ගිණුමේ බැර සටහනක් ලෙස ද, එහි ප්‍රති සටහන මූල්‍ය ගිණුමේ මුදල් හා තැම්පත් ලෙස හර සටහනක් ලෙස ඇතුළත් කරයි.
- ප්‍රාථමික ආදායම් ගලායන විට ප්‍රාථමික ආදායම් ගිණුමේ හර සටහන් ලෙස ඇතුළත් කර එහි ප්‍රති සටහන මූල්‍ය ගිණුමේ මුදල් හා තැම්පතු ලෙස බැර සටහනක් ලෙස ඇතුළත් කරයි.

❖ ද්විතියික ආදායමේ ගිණුම

- නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන සියලුම රාජ්‍ය හා පෞද්ගලික සංක්‍රාම, මෙම ගිණුමේ සටහන් කරයි.
- සංක්‍රාම ඒක පාර්ශ්වීය මූල්‍ය හෝ මූර්ත ප්‍රවාහයකි.
- රජයට ලැබෙන හා ලබාදෙන සංක්‍රාම නිල සංක්‍රාම ලෙසත්, පුද්ගලයන්ට ලැබෙන සංක්‍රාම, පෞද්ගලික සංක්‍රාම ලෙසගත් හඳුන්වයි.
- රජයට ලැබෙන හා ලබාදෙන පරිත්‍යාග හා දීමනා ඇතුළත් වන අතර, පෞද්ගලික සංක්‍රාම යටතේ විදේශගත වුවත් තම හිතවතුන්ට හා ඥාතීන්ට එවන දීමනා ඇතුළත් වේ.
- සංක්‍රාම ලැබීම් සංක්‍රාම ගිණුමේ බැර සටහනක් ලෙස ඇතුළත් කරන අතර එහි ප්‍රති සටහන මූල්‍ය ගිණුමේ මුදල් තැම්පතු ලෙස හැර සටහනක් ලෙස ඇතුළත් කරයි.
- සංක්‍රාම ගෙවීමේ සිදුවන විට සටහන් වන්නේ මෙහි ප්‍රතිවිරුද්ධ පැත්තයි.

❖ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය ලබා ගන්නේ ඉහත ගිණුම් වල ශේෂ එකතු කර ගැනීමෙනි.

ජංගම ගිණුමේ ශේෂය = භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම + විදේශ ශුද්ධ ද්විතියික ආදායම

❖ ප්‍රාග්ධන ගිණුම

- නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ප්‍රාග්ධන සංක්‍රමන ගණුදෙණු ද, නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම හා බැහැර කිරීම සම්බන්ධ ගණුදෙණු මෙම ගිණුමට ඇතුළත් කරයි.
- උදා :- තානාපති කාර්යාලයකට ඉඩමක් බදු දීම.
  බලපත්‍ර හා බදු ගිවිසුම්, සන්නම්, කීර්තිනාමය
  ආයෝජණ ප්‍රදාන

❖ මූල්‍ය ගිණුම

- නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ආශ්‍රිත අණුදෙණු මූල්‍ය ගිණුමේ ඇතුළත් කරයි.
- මූල්‍ය ගණුදෙණු වල කාර්යයාත්මක ස්වරූපය අනුව මූල්‍ය ගිණුම උප ගිණුම් 5 කින් යුක්ත වේ.
    1. ඍජු ආයෝජන
    2. කළඹ ආයෝජන (විවිධ ආයෝජන)
    3. මූල්‍ය ව්‍යුත්පන්න
    4. අනෙකුත් ආයෝජන
    5. සංචිත වත්කම්
- මෙම ගණුදෙනු ඒවායේ ශුද්ධ වටිනාකම ද්විත්ව සටහන් මූලධර්මයට අනුව හර හා බැර වශයෙන් සටහන් කරයි.
- මූල්‍ය උපකරණ වලට අදාළ ගණුදෙණු වල වත්කම් වලින් වගකීම් අඩුකරගෙන ශුද්ධ වටිනාකම ලබා ගනී.

❖ ඍජු ආයෝජන

- අනේවාසික පුද්ගලයෙකු, සමාගමක් රජය හෝ ආයතනයක්, එම ආයතනයේ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාව, මූලික කොටස් එකතුවෙන් 10% කට වඩා වැඩි හිමිකමක් ඇති අනේවාසික ආයෝජන කොටස් හිමිකම් ඍජු ආයෝජන වලට ඇතුළත් කරයි.

❖ කළඹ ආයෝජන (විවිධ ආයෝජන)

- සියලුම ණය සුරකුම් ගණුදෙණු වලට සම්බන්ධ විදේශ මුදල් ප්‍රවාහ, ඡන්ද බලය 10% කට අඩු හිමිකමක් ඇති විදේශ ආයෝජන කළඹ ආයෝජන වේ.

❖ මූල්‍ය ව්‍යුත්පන්න

- අනාගත දිනක දී යම් නිශ්චිත විචල්‍යකට හෝ වටිනාකමකට කිසියම් මූල්‍ය වත්කමක් මිලදී ගැනීමට හෝ විකිණීමට ඇති කර ගන්නා එකගතාවක් මූල්‍ය ව්‍යුත්පන්න ලෙස සළකයි.

- ❖ අනෙකුත් ආයෝජන
  - ○ උදා :- කොටස්
    - මුදල් හා තැම්පතු
    - රජයට ලැබෙන ව්‍යාපෘති ණය
    - වෙළඳ ණය
    - අත්තිකාරම්
    - රක්‍ෂණ හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා තබා ගන්නා සංචිත
    - මූල්‍ය අරමුදලේ විශේෂ ගැණුම් හිමිකම් (SDR)

  අනෙකුත් ආයෝජන ගිණුමට ඇතුළත් කරයි.

  - ○ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැණුම් හිමිකම් (SDR) වෙන් කිරීම් අනෙකුත් ආයෝජන ගිණුමේ වගකීමක් ලෙස සටහන් කරන අතර පහත සඳහන් සංචිත වත්කම් ගිණුමේ වත්කමක් ලෙස ඇතුළත් කරයි.

- ❖ සංචිත වත්කම්
  - ○ ගෙවුම් තුලන අවශ්‍යතාවයන් සහ විනිමය අනුපාතිකයේ විචල්‍යයන් වළක්වා ගනිමින්, මුදල් ඒකකය සහ ආර්ථිකය පිළිබඳ විශ්වාසය ඇතිකර ගැනීමටත්, මහ බැංකුව මගින් පාලනය කරන, අවශ්‍යවූ විට ප්‍රයෝජනයට ගත හැකි විදේශ වත්කම් සංචිත වත්කම් ලෙස හඳුන්වයි.
  - ○ උදා :- මූල්‍ය රත්‍රන්
    - විශේෂ ගැණුම් හිමිකම් (SDR)
    - ස්ථාවර ආදායම් සුරැකුම්පත්
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇති වෙනත් සංචිත
  - ○ ඉහත ගිණුම් 4 ශ්‍රේෂ වල එකතුව මූල්‍ය ගිණුමේ ශේෂය ලෙස හඳුන්වයි.
  - ○ ගෙවුම් තුලන ලේඛනයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල ශේෂ වල එකතුව මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතුය. යම් වෙනසක් ඇතිවන විට වැරදි හා අත්හැරීම් ලෙස තීරුවක් එකතු කරයි.
  - ○ ජංගම හා මූල්‍ය ගිණුම් වල ශේෂ වල එකතුවෙන් කිසියම් රටක් අවශේෂ ලෝකය තුළ ශුද්ධ ණය ගැතියෙක් ද, ශුද්ධ ණය හිමියෙක් ද යන්න හඳුනා ගැනීමට පුළුවන.
  - ○ මූල්‍ය ගිණුමට ඇතුළත් කරන ගණුදෙණු ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් කරයි.
  - ○ එම ගණුදෙණු හේතුකොට මූල්‍ය වත්කම් හිමිකර ගැනීමක් සිදුවන විට අදාල උප ගිණුමේ බැර සටහනක් ලෙස ද, එහි ප්‍රති සටහන මූල්‍ය හා තැන්පතු ලෙස හර සටහනක් ලෙස ඇතුළත් කරයි.
  - ○ මූල්‍ය වගකීම් ආශ්‍රිත ගණුදෙණු අදාළ උප ගිණුමේ හර සටහනක් ලෙස ද මුදල් හා තැම්පතු ලෙස බැර සටහනක් ලෙස ඇතුළත් කරයි.

- ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ගණුදෙණු සටහන් කරන බැවින් න්‍යායාත්මකව ගෙවුම් ශේෂය තුලනය වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ගෙවුම් තුලනය | = | ජංගම ගිණුමේ ශේෂය | + | ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | + | මූල්‍ය ගිණුමේ ශේෂය | = | 0 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ගෙවුම් තුලනය | = | ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | + | වැරදි හා අත්හැරීම් | + | මූල්‍ය ගිණුමේ ශේෂය | = | 0 |

❖ ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය

- BPM6 සංකරණයට අනුව ද්විත්ව සටහන් මූලධර්මය යටතේ ගණුදෙණු සටහන් කරන බැවින් ගෙවුම් ශේෂය අනිවාර්යෙන්ම තුලනය වේ. එම නිසා ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය හඳුනා ගැනීම අපහසුය.
- පැරණි ගෙවුම් ශේෂ ආකෘතියට අනුව "මූල්‍ය වෙනස්වීම්" හෙවත් සමස්ථ ශේෂය ලෙස අයිතමයක් පැතියත් නව ආකෘතිය තුළ එවැන්නක් නැත.
- එමනිසා ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය වෙනස් ගණනය කිරීමට සිදුවේ.
- සමස්ථ ශේෂය හෙවත් මූල්‍ය වෙනස්වීම් යනු අදාල රටේ ජාත්‍යන්තර සංචිත වල ශුද්ධ වෙනස්වීම්ය.
- ජාත්‍යන්තර සංචිත වල ශුද්ධ වෙනස්වීම් ගණනය කිරීමට සිදු වෙන්නේ වර්ෂය අවසානයේ පැවති ශුද්ධ සංචිත වලින් වර්ෂය මුල පැවති ශුද්ධ සංචිත අඩු කිරීම තුළිනි.

අභ්‍යාස ඃ-

2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ සංචිත වලට අදාළ දත්ත කීපයක් පහතින් දැක්වේ. සියලුම සංඛ්‍යා ඩොලර් මිලියන වලිනි.

| | |
|---|---|
| - රජයේ විදේශ වත්කම් | 488 |
| - මහ බැංකුවේ විදේශ වත්කම් | 7470 |
| - තැම්පතු භාරගන්නා ආයතන වල විදේශ වත්කම් | 2478 |
| - සංචිත වලට අදාල වගකීම් | 1361 |
| - 2017 වර්ෂය මුළු ශු-ද්ධ ජාත්‍යන්තර සංචිත | 4529 |

පහත සඳහන් ඒවා ගණනය කරන්න.

1. දළ නිල සංචිත වත්කම් = රජයේ විදේශ වත්කම් + මහ බැංකුවේ විදේශ වත්කම්

   = 488 + 7470

   = <u>7958</u>

2. මුළු විදේශ වත්කම් = දළ නිළ විදේශ වත්කම් + තැම්පතු භාරගන්නා ආයතන වල විදේශ වත්කම්

= 7958 + 2478

= 10436

3. ශුද්ධ ජාත්‍යන්තර සංචිත= දළ නිල සංචිත + සංචිත වලට අදාළ වගකීම්

= 7958 + 1361

= 6597

4. සමස්ථ ශේෂය = වර්ෂය අග ශුද්ධ ජාත්‍යන්තර සංචිත + වර්ෂය මුල ජාත්‍යන්තර සංචිත

= 6597 + 4529

= 2068

- විදේශ සංචිත පැවතිය හැකි ආකාර
  - මූල්‍ය රන්
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැරණුම් හිමිකම් (SDR)
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇති වෙනත් සංචිත පහසුකම්
  - විදේශ විනිමය ශේෂය
  - වෙනත් සංචිත

- ගෙවුම් ශේෂ අසමතුලිතතා
  - ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය අතිරික්තයක් හෝ හිඟයක් පැවතීම ගෙවුම් ශේෂ අසමතුලිතතාවයි.
  - සාර්ව ආර්ථික අරමුණක් වශයෙන් බාහිර ස්ථායිතාව ඇතිකර ගැනීමේදී ගෙවුම් ශේෂ අසමතුලිතතාව ගැටලුවකි.

- ගෙවුම් ශේෂ අතිරික්තයක ප්‍රතිවිපාක
  - විදේශ වත්කම් ඉහළ යාම.
  - අපනයන වල ආනයන ශක්‍යතාව ඉහළ යාම.
  - විදේශ වත්කම් ඉහළ යාම නිසා මුදල් සැපයුම ප්‍රසාරණය වීම.
  - දේශීය මුලේ විදේශ අගය ඉහළ යාම.
  - අපනයන වල තරගකාරිත්වය පහළ යාම.

❖ ගෙවුම් ශේෂයේ හිඟය මූල්‍යණය කිරීමේ කෙටි කාලීන ක්‍රියාමාර්ග
    - විදේශ සංචිත මුදල් භාවිත කිරීම.
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආධාර ලබා ගැනීම.
    - වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් කෙටිකාලීන ණය ලබා ගැනීම.

❖ ගෙවුම් ශේෂයේ හිඟය පියවා ගැනීමට ප්‍රමාණවත් විදේශ සංචිත නොමැතිවිට පහත ක්‍රියාමාර්ග අනුගමනය කරයි.
    - ආනයන සීමා කිරීම.
    - ආනයන තීරු බදු ඉහළ දැමීම.
    - විදේශ විනිමය පාලනය.

❖ ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය දිගු කාලීනව පවතින විට අනුගමනය කරන ක්‍රියා මාර්ග
    - අපනයන විවිධාංගීකරණය
    - සාම්ප්‍රදායික අපනයන දිරිගැන්වීම.
    - අපනයන ප්‍රාග්ධන කලාප පිහිටුවීම.
    - විදේශ රටවල් සමඟ වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීම.
    - ආනයන ආදේශන කර්මාන්ත නගා සිටුවීම.
    - අත්‍යවශ්‍ය නොවන ආනයන ද්‍රව්‍ය අධෛර්යමත් කිරීම.
    - දේශීය උද්ධමනය පාලනය කර අපනයනවල තිරගකාරිත්වය ඉහළ දැමීම.
    - විනිමය අනුපාතය ක්ෂයවීමට ඉඩ හැරීම.

අභ්‍යාස 01.

පහත සඳහන් ගණුදෙණු ද්විත්ව සටහන් මූලධර්මය අනුව හර හා බැර වශයෙන් සටහන් වන ආකාරය දක්වන්න.

1. ශ්‍රී ලංකා මහ බැංකුවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඩොලර් මිලියන 400 ක ණය මුදලක් ලබා ගැනීම.
2. මැද පෙරදිග සේවය කරන ගෘහ සේවිකාවක් ඩොලර් 200 ක මුදලක් ලංකාවේ සිටින තම දරුවන්ට එවීම.
3. ඇමරිකානු සංචාරකයෙකු ඩොලර් 500 ක් වටිනා විදේශ මුදල් ලංකා බැංකුවෙන් මාරු කර එයට සමාන රුපියල් ලබා ගැනීම.
4. ශ්‍රී ලංකාවේ ආයෝජකයෙකු ඩොලර් මිලියන 200 ක් වියදම් කර මාලදිවයිනේ සංචාරක හෝටල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
5. ලංකාවේ වාණිජ බැංකුවක් විදේශීය රටක් නිකුත් කළ ඩොලර් 1000 ක භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම.

6. මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමට ලබාගත් ණය මුදලක් වෙනුවෙන් ඩොලර් මිලියන 4000 ක ණය වාරිකයක් ආපසු ගෙවීම හා ඩොලර් මිලියන 400 ක ණය පොලී ප්‍රමාණයක් ආපසු ගෙවීම.

අභ්‍යාස 02.

**නිපුණතා මට්ටම 10.3 විදේශ සම්පත් පරතරය හා විදේශ වස්කම්වල ආනයන ශක්‍යතාව වෙනස් වූ ආකාරය විශ්ලේෂණය කරයි.**

- විදේශ සම්පත් පරතරය යනු ආර්ථිකයට ගලාඑන විදේශ විනිමය ලැබීම් හා ආර්ථිකයෙන් ගලායන ගෙවීම් අතර වෙනසයි.
    - විදේශ සම්පත් පරතරය යනු ආර්ථිකයට ගලා එන විදේශ විනිමය ලැබීම් හා ආර්ථිකයෙන් ගලා යන ගෙවීම් අතර වෙනසයි.
    - විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම්
    - විදේශ විනිමය ලැබෙන ආකාරය
        - අපනයන
        - සේවා ලැබීම්
        - ප්‍රාථමික ආදායම් ලැබීම්
        - ද්විතීයික ආදායම් ලැබීම්
    - විදේශ ගෙවීම් ඇතිවන ආකාරය
        - ආනයන ගෙවීම්
        - සේවා ගෙවීම්
        - ප්‍රාථමික ආදායම් ගෙවීම්
        - ද්විතීයික ආදායම් ගෙවීම්
        - ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම්
        - ආයෝජන ගලායාම්
        - වාණිජ බැංකු මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම.

- විදේශ සම්පත් පරතරය සෘණ අගයක් ගැනීමට හේතු
    - අපනයන වලට සාපේක්ෂ ආනයන වැඩිවීම.
    - ප්‍රාථමික ආදායම් ලැබීම් වලට සාපේක්ෂව ප්‍රාථමික ආදායම් ගෙවීම් වැඩිවීම.
    - ණය ආපසු ගෙවීම් වැඩිවීම.
    - වාණිජ බැංකු විදේශ රටවලට කරන ගෙවීම් ප්‍රමාණය වැඩිවීම.

- ❖ විදේශ සම්පත් පරතරයේ ඍණ අගයක් පැවතීම ආර්ථිකය මත ඇතිකරන ප්‍රතිවිපාක
    - විදේශ වත්කම් ප්‍රමාණය අඩුවීම.
    - විදේශ ණය ගැනීම් වැඩිවීම.
    - මුදලේ විදේශ අගය පහළයාම.
    - මුදල් සැපයුම අඩුවීම.
    - විදේශ ණය සේවාකරණ ගෙවීම් ඉහළ යාම.
    - ජාත්‍යන්තර ණය පාෂයකට අඩුවීම.

- ❖ විදේශ සම්පත් පරතරය පියවා ගන්නා ආකාරය.
    - කෙටි කාලීන ණය ලබා ගැනීම.
    - ණය සැපයුම් කරුවන්ගෙන් ණය ගැනීම.
    - බැංකු ණය ලබා ගැනීම.
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබා ගැනීම.
  - ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටවල් වර්ගීකරණයෙන් ඉහළ මැද ආදායම් ලබන රටක් ලෙස නම් කිරීමෙන් පසු ලංකාවට ලැබෙන සහන මා ප්‍රදාන සීමා වී ඇත. එම නිසා විදේශ ණය ලබා ගැනීමට සිදුවීමෙන් ණය පිරිවැය අධික වීමක් දක්නට ලැබේ.

- ❖ විදේශ වත්කම් හිමිකාර්තිවය
    - මහ බැංකුව සතු විදේශ වත්කම්
    - රජය සතු විදේශ වත්කම්
    - තැම්පතු භාරගන්නා ආයතන සතු විදේශ වත්කම්
  - මහ බැංකුව හා රජය සතු විදේශ වත්කම් නිල විදේශ වත්කම් ලෙස හඳුන්වයි.
  - මහ බැංකුව, රජය හා තැම්පතු භාර ගන්නා ආයතන සතු විදේශ වත්කම් දළ මුළු විදේශ වත්කම් ලෙස හඳුන්වයි.

- ❖ විදේශ වත්කම් පැවතීමේ වැදගත්කම
    - මුදලේ විදේශ අගය ස්ථාවරව පවත්වා ගැනීමට හැකිවීම.
    - මුදල් සැපයුම තීරණය කිරීමට
    - ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමට
    - විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට
    - ආනයන ශඛ්‍යතාව පිරික්සීමට
    - මූල්‍ය අධිකාරියට විදේශ විනිමය වෙළෙඳපොලට බලපෑම් කිරීමේ හැකියාව තීරණය කිරීමට.

❖ විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාව

- ○ පවතින විදේශ වත්කම් වලින් කොපමණ මාස ගණනක් ඉදිරියට ආනයන හැකියාවක් තිබේ ද යන්න ආනයන ශක්‍යතාවයි.

$$\text{විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාව} = \frac{\text{විදේශ වත්කම් ප්‍රමාණය}}{\text{වාර්ෂික ආනයන වටිනාකම}} \times 12$$

අභ්‍යාස :-

කල්පිත ආර්ථිකයක වර්ෂය අවසානයේ මුළු විදේශ වත්කම් ප්‍රමාණය ඩොලර් මිලියන 6000 ක් වූ අතර වාර්ෂික සාමාන්‍ය ආනයන වටිනාකම ඩොලර් මිලියන 16000 කි. ආනයන ශක්‍යතාව ගණනය කරන්න.

**නිපුණතා මට්ටම 10.4 විදේශ ආයෝජන රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි.**

❖ විදේශ ආයෝජන

- ○ රටක්, ආයතනයක් හෝ පුද්ගලයෙකු හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ නව ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාර වල කොටස් වැඩි සංඛ්‍යාවක් මිලදී ගැනීම විදේශ ආයෝජන ලෙස හඳුන්වයි.
- ○ විදේශ ආයෝජන වල ස්වරූප 2 යි.
  - ▪ ඍජු විදේශ ආයෝජන
  - ▪ කළඹ විදේශ ආයෝජන
- ○ ඍජු විදේශ ආයෝජන යනු ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශ රටක ඵලදායි මූර්ත වත්කම් අත්පත් කර ගැනීමයි.
- ○ උදා :- කර්මාන්ත ශාලා, ඉදි කිරීම් ව්‍යාපාර පවත්වාගෙන යාම.

❖ විදේශ ඍජු ආයෝජන වල හිතකර හා අහිතකර ප්‍රතිවිපාක.

- ○ සාධක සංචලනය හේතුකොට ගෙන සම්පත් කාර්යක්ෂමව බෙදීයාම ඉහළ යාම.
- ○ විදේශ ප්‍රාග්ධනය රට තුලට ගලා ඒම තුළින් සම්පත් භාවිතය ඉහළයාම.විදේශ සම්පත් පරතරය පියවා ගැනීමට හැකිවීම.
- ○ ගෙවුම් ශේෂ හිඟයට පිළියමක් වීම.
- ○ ණය බර අඩුකර ගැනීමට හැකිවීම.
- ○ නව තාක්ෂණය හා කළමණාකරණය ලබාගත හැකි වීම.

❖ ඍජු විදේශ ආයෝජන

- ○ ආයෝජන ආදායම් රටින් පිටරටට ගලායාම.
- ○ දේශීය ආර්ථි කටයුතු දුර්වල වීම.

- ප්‍රාග්ධන සූක්ෂම ශිල්පීය ක්‍රම භාවිතා කිරීම නිසා රැකියා අවස්ථා අඩුවීම.
- දේශීය ළදරු කර්මාන්ත දුර්වල වීම.
- ස්වභාවික සම්පත් අධි උපයෝජනය වීම.

❖ කළඹ ආයෝජන

- මූල්‍ය ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් වෙනත් රටක මූල්‍ය වත්කම් මිලදී ගැනීම කළඹ ආයෝජන ලෙස හඳුන්වයි.
- උදා :- කොටස් මිලදී ගැනීම, තිළිණපත් ණයකර, වාණිජ පත්‍රිකා ආශ්‍රිතව කරන ආයෝජන කළඹ ආයෝජන වේ.

**නිපුණතා මට්ටම 10.5 විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය විශ්ලේෂණය කරයි.**

❖ විදේශ විනිමය වෙළෙඳපොල

- විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධව ගණුදෙණු සිදු කිරීමට සැදුම්පත් ආයතනික ව්‍යුහය විදේශ විනිමය වෙළඳපොලයි.
- ජාත්‍යන්තර වෙළෙඳපොල පහසු කිරීමට, විදේශ විනිමය සපයා දීම සඳහා විදේශ විනිමය වෙළෙඳපොල සංවිධානය වී ඇත.
- විදේශ විනිමය වෙළෙඳපොල වල ගණුදෙණු දුරකතන හා විද්‍යුත් තැපැල ආශ්‍රයෙන් සිදුවේ.

❖ විදේශ විනිමය වෙළෙඳපොලට සම්බන්ධ වන පාර්ශවයන්

- වාණිජ බැංකු
- විදේශ විනිමය තැරැව්කරුවන්
- ව්‍යාපාරික ආයතන
- මහ බැංකුව
- ආණ්ඩුව හා මහජනතාව

❖ විදේශ විනිමය අනුපාතිකය

- කිසියම් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් තවත් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් සමඟ හුවමාරු වන අනුපාතය විදේශ විනිමය අනුපාතිකය ලෙස හඳුන්වයි.
- විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කළ හැකි ආකාර 2 යි.
    1. විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක මිල දේශීය මුදලින් ප්‍රකාශ කිරීම. මෙය ඍජු කියවීම ලෙස හඳුන්වයි.
    2. දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම. මෙය වක්‍ර කියවීම ලෙස හඳුන්වයි.

- ❖ ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා වන විනිමය අනුපාත ක්‍රම
    - ○ නාමික විදේශ විනිමය අනුපාතය
    - ○ මූර්ත විදේශ විනිමය අනුපාතය
    - ○ නාමික සඵල විදේශ විනිමය අනුපාතිකය
    - ○ මූර්ත සඵල විදේශ විනිමය අනුපාතය

- ❖ නාමික විනිමය අනුපාතය
    - ○ කිසියම් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් වෙනත් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් සමඟ හුවමාරු වෙන අගය ඍජු හෝ වක්‍ර ක්‍රමයට ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාත ක්‍රමයයි.
    - ○ මෙය තීරණය වන ආකාර 3 ක් තිබේ.
        1. නම්‍ය විනිමය අනුපාත ක්‍රමය
        2. පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමය

- ❖ මූර්ත විනිමය අනුපාත ක්‍රමය
    - ○ මූර්ත විනිමය අනුපාතිකය යනු විනිමයට සම්බන්ධ රටවල් දෙකේ උද්ධමන අනුපාතික, නාමික විනිමය අනුපාතිකයට ගලපා ගැනීමෙන් ලබා ගන්නා විනිමය අනුපාතිකයේ අගයයි.

මූර්ත විනිමය අනුපාතිකය = $\dfrac{\text{නාමික විනිමය}}{\text{අනුපාතිකය}} \times \dfrac{\text{විදේශ රටේ උද්ධමන අනුපාතිකය}}{\text{රටේ උද්ධමන අනුපාතිකය}}$

$$RER = NER \times \frac{Pd}{PF}$$

RER = මූර්ත විනිමය අනුපාතිකය

NER = නාමික විනිමය අනුපාතිකය

Pd = විදේශ රටේ උද්ධමන අනුපාතිකය

PF = රටේ උද්දමන අනුපාතිකය

- ❖ මූර්ත විනිමය අනුපාතිකය පහළ යාම.
    - ○ වර්ෂය මුල මූර්ත විනිමය අනුපාතිකයට සාපේක්ෂව වර්ෂය අවසානයේ මූර්ත විනිමය අනුපාතිකය පහළ අගයක් ගැනීමයි.
    - ○ මූර්ත විනිමය අනුපාතිකය පහළ යන අවස්ථා
        1. දේශීය හා විදේශීය මිල මට්ටමේ ස්ථාවරව තිබියදී නාමික විනිමය අනුපාතිකය පහළ යාම.
        2. නාමික විනිමය අනුපාතිකය සහ රටවල් දෙකේම උද්ධමන අනුපාතික පහළ යාම.

3. නාමික විනිමය අනුපාතිකය සහ දේශීය උද්ධමනය ස්ථාවරව තිබියදී විදේශීය මිල උද්ධමනය පහළ යාම.

❖ මූර්ත අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක
  - අපනයන තරගකාරිත්වය ශක්තිමත් වීම.
  - ආනයන අධෛර්යමත් වීම.
  - වෙළෙඳ ගිණුම යහපත් ප්‍රවනතාවක් ඇති වීම.

❖ නාමික සඵල විනිමය අනුපාතිකය
  - කිසියම් රටක මුදල් ඒකකයක අගය තවත් රටවල් රාශියක මුදල් ඒකක වල බරතබන ලද සාමාන්‍ය අගයට ප්‍රකාශ කිරීම සඵල විනිමය අනුපාතිකයයි.
  - එය දර්ශක අංකයක් ලෙස ප්‍රකාශ කරන අතර බර තැබීම සඳහා යොදා ගන්නේ කිසියම් රටක් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ හවුල්කාරී හා වෙළෙඳ තරගකාරී රටවල මුදල් ඒකක වලිනි.
  - තරගකාරී හා හවුල්කාරී රටවල මුදල් ඒකක වල බර තබන ලද සාමාන්‍ය අගය නාමික සඵල විනිමය අනුපාතිකය වේ.

❖ මූර්ත සඵල විනිමය අනුපාතිකය
  - නාමික සඵල විනිමය අනුපාතයට රටවල් දෙකේ උද්ධමන අනුපාත ගලපා ගැනීමෙන් මූර්ත සඵල විනිමය අනුපාතය ලබා ගැනීමට පුළුවන.

$$\text{මූර්ත සඵල විනිමය අනුපාතය} = \text{නාමික සඵල විනිමය අනුපාතිකය} \times \frac{\text{විදේශ රටේ උද්ධමන අනුපාතිකය}}{\text{රටේ උද්ධමන අනුපාතිකය}}$$

❖ නාමික සඵල විනිමය අනුපාතිකය හා මූර්ත සඵල විනිමය අනුපාතිකය ගණනය කරන ආකාරය සරළ උදාහරණයක් මගින්

| වෙළඳ හවුල්කරුවන් | නාමික විනිමය අනුපාතිකය R | විදේශ වෙළෙඳාම මත බර තැබීම W | R × W | ලංකාවේ උද්ධමන අනුපාතය | විදේශ රටේ උද්ධමන අනුපාතය | වෙනස |
|---|---|---|---|---|---|---|
| ඇමරිකාව | ඩොලර් 1 = රු. 180 | 20 | 3600 | 8 | 10 | -2 |
| බ්‍රිතාන්‍ය | ඩොලර් 1 = රු. 220 | 10 | 2200 | 8 | 12 | -4 |
| ඉන්දියාව | Rs 1 = රු. 2.50 | 50 | 125 | 8 | +5 | 3 |
| චීනය | 1U = ර. 3 | 15 | 45 | 8 | 10 | -2 |
| ජපානය | 1F = රු. 2 | 5 | 10 | 8 | 5 | 3 |
| | | εW = 100 | εRW = 5980 | | | -2 |

නාමික සඵල විනිමය අනුපාතිකය $= \frac{\varepsilon RW}{\varepsilon W}$

$= \frac{5980}{100}$

$= \underline{\underline{59.80}}$

මූර්ත සඵල විනිමය අනුපාතිකය = 59.80 + (-2)

$= \underline{\underline{57.80}}$

**නිපුණතා මට්ටම 10.6 විදේශ විනිමය අනුපාතික ක්‍රම තුලනාත්මකව විස්තර කරයි.**

- නාමික විනිමය අනුපාතය තීරණය වන අකාර 3 කි.
  1. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය
  2. නම්‍ය විනිමය අනුපාත ක්‍රමය
  3. පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමය

- ස්ථාවර අනුපාත පාලන තන්ත්‍රය ලෙස හඳුන්වන්නේ මෙම අනුපාත ක්‍රම 3 යි.

❖ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය

- යම් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් තවත් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් සමග හුවමාරු වන වටිනාකම එම රටේ මූල්‍ය බලාධිකාරය තීරණය කර අඛණ්ඩව පවත්වා ගෙන යාම ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයයි.
- මෙම ක්‍රමය යටතේ විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමක් හෝ ඌණ තක්සේරු වීමක් සිදු විය හැකිය.

❖ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයේ වාසි

- විනිමය අනුපාතය ස්ථාවර අගයක් ගැනීම නිසා අපනයන හා ආනයන කරුවන්ගේ වෙළෙඳ ප්‍රවාහයන් අවධානමකින් තොරව කරගෙන යාමට හැකිවීම.
- අනුපාතිකය ස්ථාවර වීම නිසා විදේශ ආයෝජකයන්ගේ අවිනිශ්චිත බව අඩුවීම.
- විනිමය අනුපාතිකය පිළිබඳ අවිනිශ්චිත බවක් නොමැති බැවින් දේශීය ආර්ථිකය කළමණාකරණය කර ගැනීමේ පහසුවක් ඇතිවීඹ.
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් පවතින විට විනිමය අනුපාතය මත පදනම් වූ සමසේක්ෂණ ක්‍රියා සිදු නොවීම.
- අපනයන වල තරගකාරිත්වය ඉහළ නංවා ගැනීමට අපනයන කරුවන් පෙළඹීම. (අනුපාතිකයේ වෙනස්වීම මත වාසි ලබාගත නොහැකි බැවින්)

❖ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයේ අවාසි

- ගෙවුම් ශේස අවධානම් වලට මුහුණ දීමට විශාල විදේශ සංචිත පවත්වා ගැනීමට සිදුවීම.
- ස්ථාවර විනිමය අනුපාතිකය අධි තක්සේරු වූ විට හෝ ඌණ තක්සේරු වූ විට, ගෙවුම් ශේෂය මත පීඩන ඇති කිරීම.
- විදේශ විනිමය සංචිත අවසන් වන විට ගෙවුම් ශේෂය පියවා ගැනීමට විකල්ප මාර්ග සෙවීමට සිදුවීම.
- විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමට සිදුවීම.

❖ නම්‍ය විනිමය අනුපාත ක්‍රමය

- විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අනුව හුවමාරු අගය ස්වයංක්‍රීයව තීරණය වීම නම්‍ය විනිමය අනුපාත ක්‍රමයයි.
- මෙය පාවෙන විනිමය අනුපාත ක්‍රමය දෙ හඳුන්වයි.
- මහ බැංකුව විනිමය වෙළෙඳපොලට සම්බන්ධ වීමක් සිදු නොවේ.

❖ විනිමය සඳහා ඉල්ලුමක් හට ගන්නේ

- එම රටේ අපනයන
- එම රටේ සංචාරක පැමිණීම
- එම රටට ප්‍රාග්ධන සම්පත් ලැබීම
- එම රටට විදේශ ප්‍රධාන ලැබීම.

මෙම කාර්යයන් සඳහා විදේශ මුදල් දේශීය මුදල් බවට පත්කළ යුතුය. දේශීය මුදල් සඳහා ඉල්ලුමක් ඇතිවන්නේ ඒ ආකාරයටය.


❖ විනිමය සඳහා සුපයුමක් හටගන්නේ,

- එම රටේ ආනයන
- එම රටෙන් විදේශ රටවල සංචාරය කිරීම.
- එම රටෙන් වෙනත් රටවලට ප්‍රාග්ධනය ගලා යාම.
- එම රට වෙනත් රටවලට සංක්‍රාම ලබාදීම.


මෙම කාර්යයන් සඳහා දේශීය මුදල් සපයා විදේශ මුදල් බවට පත්කළ යුතුය.

❖ ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුමක් හා සැපයුමක් හට ගන්නේ කෙසේද? ප්‍රස්තාර සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න.


- ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුමක් හට ගන්නේ අපනයන ගැණුම්කරුවන්ගෙන් සහ ශ්‍රී ලංකාවට ප්‍රාග්ධනය රැගෙන එන්නන්ගෙන්.
- රුපියල් ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.




- රුපියලේ බාහිර අගය ඉහළ මට්ටමක පවතින විට රුපියල් සමඟ හුවමාරු වීමට වැඩි විදේශ මුදලක් අවශ්‍ය බැවැන් ලංකාවේ අපනයන මිලදී ගැනීම හා රට තුළට ප්‍රාග්ධනය ගලාඒම අඩු වී රුපියල් ඉල්ලුම අඩුවේ.
- රුපියලේ බාහිර අගය පහළ මට්ටමක පවතින විට රුපියල් සමඟ හුවමාරු වන විදේශ මුදල් ප්‍රමාණය අඩු බැවින් රුපියල් සඳහා ඉල්ලුම වැඩි වේ. ලංකාවේ අපනයන වැඩි වීමටත්, ලංකාවට ප්‍රාග්ධනය වැඩිපුර ගලා ඒමටත් හේතුවේ.
- ශ්‍රී ලංකාවේ රුපියල් සඳහා සැපයුමක් ඇතිවන්නේ ආනයන කරුවන් සහ රටින් පිටතට ප්‍රාග්ධනය ගලායාම හේතුවෙන්ය.




- රුපියලේ බාහිර අගය ඉහළ මට්ටමක පවතින විට දේශීය මුදල් අඩු ප්‍රමාණයකින් විදේශීය මුදල් ලබා ගැනීමට හැකි බැවින් ආනයන ශක්තිමත් වන අතර රටෙන් ප්‍රාග්ධනය ගලායාම වැඩි වී රුපියල් සැපයුමද වැඩි වේ.
- රුපියලෙලල් බාහිර අගය පහළ මට්ටමක පවතිව විට විදේශ මුදල් සමඟ හුවමාරු වන දේශීය මුදල් ප්‍රමාණය වැඩි බැවින් ආනයන මෙන්ම ප්‍රාග්ධනය ගලායාම අඩු වී රුපියල් සැපයුම අඩු වේ.




❖ නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ වාසි

- විනිමය අනුපාතිකය ඉල්ලුම හා සැපයුම අනුව ස්වයංක්‍රීයව තුලනය වන බැවින් විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමක් හෝ ඌණ තක්සේරු වීමක් සිදු නොවේ.
- ගෝලීය ආර්ථික සම්පත්, විකල්ප හමුවේ කර්යක්ෂමව භාවිතයට ගැනීමට හැකිවීම.
- ප්‍රතිපත්ති සම්පාදකයන්ට බාහිර ස්ථායිතාව ගැන අවධානය යොමු නොකර අභ්‍යන්තර ස්ථායිතාව ගැන අවධානය යොමු කළ හැකිවීම.
- මූල්‍ය ප්‍රතිපත්තිය බාහිර බලපෑමකින් තොරව ශක්තිමත් මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ හැකිවීම.
- විනිමය අනුපාතිකය ස්වයංක්‍රීයව තුලනය වන බැවින් අනුපාතිකයේ අවිනිශ්චිතතා හට නොගන්නා බැවින් විශාල වශයෙන් විදේශ විනිමය සංචිත පවත්වා ගැනීමට අවශ්‍ය නොවීම. ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු නොවන බැවින්, විවෘත වෙළඳාම ශක්තිමත් වීම හා ඒ තුළින් උපරිම සමාජ සුභසාධනයක් ලඟා කර ගැනීමට හැකිවීම.

❖ නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ අවාසි.

- වෙළෙඳ ප්‍රවාහයන් කෙරෙහි අහිතකර ලෙස බලපෑම. එනම් විනිමය අනුපාතිකය නිරන්තර උච්ඡාවචනය වීම නිසා අපනයන කරුවන්ගේ හා ආනයන කරුවන්ගේ තීරණ කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- විදේශ ආයෝජකයන්ට ණය සැපයුම් කරුවන්ට අහිතකර ලෙස බලපෑම.
- විනිමය වෙළෙඳපොලේ සමපේක්ෂණ ක්‍රියා බහුල වීමෙන්, විනිමය අනුපාතිකය තව දුරටත් උච්ඡාවචනයට වීම.
- විනිමය අනුපාතිකය නිරන්තර උච්ඡාවචනය වීමෙන් මූල්‍ය ප්‍රතිපත්තියේ සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ විනය බිඳ වැටීම.

❖ පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමය

- ස්ථාවර හා නම්‍ය විනිමය අනුපාත ක්‍රම වල යහපත් ලක්‍ෂණ වල ප්‍රයෝජන ලබා ගැනීමට ඇතැම් රටවල් පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කරයි.
- මෙම ක්‍රමය යටතේ සිදුවන්නේ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යටතේ මූල්‍ය බලාධිකාරිය විසින් අනුපාතිකය තීරණය කර කිසියම් පරාශයක් දක්වා පාවීමට සැළැස්වීමයි.
- පරාශය ඉක්මවා විනිමය අනුපාතිකය චලනය වන විට මූල්‍ය අධිකාරිය විනිමය වෙළෙඳපොලට සම්බන්ධ වී විනිමය මිලදී ගැනීම හා විකිණීම මගින් පරාශය තුළ පවත්වා ගැනීමට කටයුතු කරයි.
- මූල්‍ය අධිකාරිය විනිමය වෙළෙඳපොලට සම්බන්ධ වන බැවින් විනිමය අනුපාතිකය අපිරිසිදු පාවීමක් ලෙස මෙම ක්‍රමය හඳුන්වයි.

**නිපුණතා මට්ටම 10.7 විනිමය අනුපාතිකය වෙනස්වීම සහ එහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.**

- විනිමය අනුපාතිකය වෙනස් වන්නේ නම්‍ය ිනිමය අනුපාත ක(මයක් යටතේ දීය.
- විනිමය අනුපාතිකය වෙනස් වීමට ඉවහල් වන සාධක කීපයකි.
  - වෙළෙඳ ප්‍රවාහ වෙනස්වීම.
  - ප්‍රාග්ධන සංචලන වෙනස්වීම.
  - රට රටවල් මිල මට්ටමේ විචලනය
  - සමපේක්ෂණ ක්‍රියා වෙනස්වීම.
  - රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම.
  - දේශපාලනික තත්ත්වය.

❖ විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හා විනිමය අනුපාතිකය ක්ෂය වීම.

- විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම යනු ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් යටතේ දේශීය මුදලේ විදේශ අගය පහත දැමීමයි.
- විනිමය අනුපාතිකය ක්ෂයවීම යනු නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් යටතේ දේශීය මුදලේ විදේශ අගය පහළ යාමයි.
- විනිමය අවප්‍රමාණය කිරීම හා විනිමය ක්ෂය වීම යන අවස්ථා දෙකේදීම සිදු වෙන්නේ දේශීය මුදලේ විදේශ අගය පහළ යාමයි. එහෙත් අනුපාත ක්‍රම දෙකක් යටතේ එය සිදුවේ.

❖ විනිමය අනුපාතිකය අව ප්‍රමාණය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක

- ආනයන වල දේශීය මිල ගණන් ඉහළ යාම.
- ආනයන වියදම ඉහළ යාම.

- ආනයන මත දේශීය ඉල්ලුම රඳා පවතී නම් දේශීය උද්ධමනය ඉහළ යාම.
- විදේශ ණය වාරිකය හා පොලිය ඉහළ යාම.
- ගෙවුම් තුලන ලේඛනයේ සේවා ගිණුමේ ශේෂය හිතකර වීම.
- විදේශ වලින් ලැබෙන සේවා නියුක්ති ප්‍රේශණ ඉහළ යාම නිසා සංක්‍රාම ගිණුමේ ශේෂය යහපත් වීම.
- අපනයන ඉල්ලුම ඉහළ යාම.
- ආනයන මිල ගණන් ඉහළ යාම නිසා ආනයන මත පැවති ඉල්ලුම දේශීය භාණ්ඩ වෙත යොමු වීම.

❖ විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රාමණය කිරීම.
- දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල් වලින් ඉහළ යාම විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය කිරීම ලෙස හඳුන්වයි.

❖ විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක
- ආනයන වල දේශීය මිල ගණන් පහළ යාම.
- උද්ධමන අනුපාතිකය පහළ යාම.
- විදේශ ණය වල දේශීය මූල්‍ය වටිනාකම පහළ යාම.
- විදේශීය ණය සේවා පිරිවැය අඩු වීම.
- අපනයන ඉල්ලුම අඩුවීම.
- වෙළඳ ශේෂය කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- විදේශීය ණය ආපසු ගෙවීමේ පිරිවැය අඩුවීම.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ඉපැයීම්වල දේශීය මුදල් වටිනාකම අඩුවීම.

❖ විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමෙන් අපේක්ෂිත අරමුණ
- ගෙවුම් ශේෂයේ දිගු කාලීන හිඟය අඩුකර ගැනීම.
- ආනයන ඉල්ලුම අධෛර්යමත් කිරීම.
- අපනයන ඉල්ලුම වැඩිකර ගැනීම.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේශණ දිරිමත් කිරීම.
- විදේශ ඍජු ආයෝජන වැඩිකර ගැනීම.

❖ විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමේ, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට පැවතිය යුතු කොන්දේසි
- අපනයන සඳහා ඉල්ලුම නම්‍ය වීම.
- ආනයන සඳහා දේශීය ඉල්ලුමේ මිල නම්‍ය වීම.
- අපනයන හා ආනයන ඉල්ලුමෙහි මිල නම්‍යතාව වෙන් වෙන්ව නම්‍ය නොවුවත් එම දෙකේ නම්‍යතාවන්ගේ එකතුව එනට වැඩි හෙවත් නම්‍ය වීම. මෙය මාර්ෂල් ලර්නර් කොන්දේසිය ලෙස හඳුන්වයි.
- අපනයන සඳහා දේශීය සැපයුම් නම්‍යවීම.

- දේශීය මිල මට්ටම ස්ථාවර වීම.

**නිපුණතා මට්ටම 10.8 බහුපාර්ශවීය මූල්‍ය ආයතන වල කාර්යයන් විමසයි.**

- බහු පාර්ශවිය මූල්‍ය ආයතන
  - ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව ශක්තිමත් කිරීමටත්
  - ලෝක වෙළෙඳාම වර්ධනය කිරීමටත්
  - විනිමය අනුපාතිකය ක්‍රමවත්ව පවත්යාගෙන යාමත්

  අරමුණු කරගෙන ලෝකයේ රටවල් පිහිටුවාගෙන ඇති, මූල්‍ය ආයතන බහු පාර්ශවීය මූල්‍ය ආයතන ලෙස හඳුන්වයි.

- ප්‍රධාන බහු පාර්ශවීය මූල්‍ය ආයතන දෙකකි.
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
  - ලෝක බැංකුව

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
  - අ945 දෙසැම්බර් 27 ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආරම්භ කරන ලදී.
  - වර්තමාන සාමාජික සංඛ්‍යාව රටවල් 186 කි.
  - ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, විනිමය අනුපාතික වල ස්ථාවරත්වය හා විධිමත්භාවය හා ආර්ථික වෘද්ධිය මෙන්ම සාමාජික රටවල සේවා නියුක්තිය ඉහළ නංවමින්, ගෙවුම් ශේෂය අර්බුධ වලදී සාමාජික රටවලට මූල්‍යාධාර සැපයීම සිදු කරයි.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුණු
  - ජාත්‍යන්තර මූල්‍ය ගැටළු වලදී මූල්‍ය සහයෝගිතාවය වර්ධනය කිරීම.
  - සාමාජික රටවල නිෂ්පාදන සම්පත් සංවර්ධනය කිරීම හා සේවා නියුක්තිය මෙන්ම මූර්ත ආදායම පවත්වාගෙන යාමටත්, අන්තර්ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයක් ඇතිකර ගැනීමට පහසුකම් සැලසීම.
  - සාමාජික රටවල විනිමය අනුපාතික වල ක්‍රමවත් බව ඇතිකර ගැනීමෙන්, විනිමය අනුපාතික ස්ථාවරව පවත්වාගෙන යාමට සහාය වීම.
  - සාමාජික රටවල මූල්‍ය අර්බුධ වලදී තාවකාලික ණය පහසුකම් ලබා දීම හා දිගුකාලීන ආර්ථික ගැයළු වලදී මූල්‍ය පහසුකම් ලබා දෙමින් ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා උපදෙස් ලබා දීම.
  - සාමාජික රටවල් අතර බහුපාර්ශවීය ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කරමින් අන්තර්ජාතික වෙළෙඳාමට බාධා පමුණුවන විදේශ විනිමය සීමාවන් ඉවත් කිරීම.
  - ගෙවුම් ශේෂ සැලසුම් ඇතිකර ගැනීමට සාමාජික රටවලට අරමුදල් සැපයීම.
  - සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතා අවම කර ගැනීමට අවශ්‍ය සහාය ලබාදීම.

❖ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යයන්.

- ජාතික හා ලෝක ආර්ථික අනතුරු දායක තත්ත්වයට පත්වන විට නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- බැංකු හා මූල්‍ය කටයුතු වල ගුණාත්මකභාවය ඇතිකර ගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- හදිසි මූල්‍ය අර්බුධ වලදී සාමාජික රටවලට ණය පහසුකම් ලබා දීම.
- දිගු කාලීන මූල්‍ය අර්බුධ වලදී අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා දීම හා ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීඹ.
- සාමාජික රටවලට තාක්ෂණික සහාය ලබා දීඹ හා මහ බැංකු නිලධාරීන් පුහුණු කිරීම.
- සාමාජික රටවලට රාජ්‍ය මූල්‍ය, විදේශ මූල්‍ය හා ජාතික ගිණුම් පිළිබඳ ප්‍රමිති සැකසීම හා තොරතුරු ප්‍රකාශ කිරීම.

❖ ලෝක බැංකුව

- දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් යූරෝ රටවල් පුනරුත්තාපනය කිරීම සඳහා 1947 මාර්තු 01 වන දින ලෝක බැංකුව ආරම්භ කරන ලදී.
- වර්තමානයේ රටවල් 186 ක් සාමාජිකත්වය දරයි.
- ලෝක බැංකුව ප්‍රධාන ආයතන 02 කින් යුක්ත වේ.
  1. ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව
  2. අන්තර්ජාතික සංවර්ධන සංගමය

❖ ලෝක බැංකුවේ අරමුණු

- සාමාජික රටවල ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා නිෂ්පාදන කටයුතු සඳහා පහසුකම් සැපයීම.
- සාමාජික රටවලට ඍජු විදේශ ආයෝජන නොලැබෙන විට විදේශ පෞද්ගලික ආයෙතන දිරිගැන්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- මහ බැංකුවේ අරමුදල් සහ වෙනත් අරමුදල් මාර්ගයෙන් සාමාජික රටවල ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා දිගු කාලීන ණය සැපයීම.
- සාමාජික රටවලට කාර්මික හා ශිල්පීය උපදෙස් ලබා දීම.
- සාමාජික රටවල නිෂ්පාදන සම්පත් වර්ධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳාමේ සමබර වර්ධනයක් ඇතිකරලීම.
- ලෝකයේ දිළිඳු බව අඩු කිරීම.

❖ ලෝක බැංකුවේ කාර්යයන්

- සාමාජික රටවලට මුදල් හා තාක්ෂණික ආධාර සැපයීම.
- සාමාජික රටවලට සහනදායි කොන්දේසි යටතේ ණය ලබාදීම.

- සාමාජික රටවලට විදේශ ආයෝජන ලබා ගැනීමට සහාය වීම.
- සාමාජික රටවල සංවර්ධනය වේගවත් කිරීමට අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීමට හා අධීක්ෂණය කිරීමට ලෝක බැංකු විශේෂඥයන්ගේ සහාය ලබාදීම.
- තිරසාර සංවර්ධනයක් ඇතිකර ගැනීම සඳහා ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමටත්, ආර්ථික ඵලදායිතාව ඉහල නැංවීමටත්, පරිසරය ආරක්‍ෂා කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සහයෝගීතාව වැඩි කිරීමටත් කටයුතු කිරීම.
- සාමාජික රටවල ගෝලීයකරණය, ගමන් මඟට ප්‍රවේශ වීමට උදව් දීම.
- ලෝක වෙළෙඳපොලේ මුහුණ දීමට සිදු වී ඇති අවාසිදායක තත්වයන් සමනය කර ගැනීමට උදව් දීම.
- ලෝක ප්‍රජාව සමඟ යහපත් සබඳතා ගොඩනගා ගැනීමට සහාය වීම.
- නව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සාමාජික රටවලට සහාය ලබාදීම.